# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1963/4 - 2016 අප්‍රේල් මස 18 වැනි සඳුදා - 2016.04.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය.*: MTR/LND/ACQUI/L1/3942.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය* :-

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කනත්තගොඩ උතුර ග්‍රාම නිලධාරී වසමේ වැවහමන්දූව ගමේ පිහිටි මු. පි. මාර 2661 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන මතු සඳහන් ඉඩම සුනාමි ව්‍යසනයෙන් අවතැන්වූවන් සඳහා බෙදා දීමට ඉඩම් අත්කර ගනු ලැබේ.

**උපලේඛනය**

**කැබලි අංක 01**

ඉඩමේ නම: පුවක්වත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, අවුරුදු දහයක් (10) - විස්සක් (20) පමණ වයසැති මිශ්‍ර භෝග වගාවක්, ස්ථිර ගොඩනැගිලි දහයක් (10) සහ ළිඳක් ඇත; හිමිකම් කියන අය: පූජ්‍ය හක්මණ ධම්මරතන හිමි, විහාරාධිපති කොටිකාගොඩ විහාරය, වැවහමන්දූව, මාතර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5260.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 මැයි මස 05 වැනි දින පෙ. ව. 10.30ට මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 අප්‍රේල් මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

රංජිත් යාපා,
ප්‍රාදේශීය ලේකම්.
මාතර.

2016 අප්‍රේල් මස 11 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 05

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය.*: MTR/LND/ACQUI/L1/3940.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය* :-

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කනත්තගොඩ උතුර ග්‍රාම නිලධාරි වසමේ වැවහමන්දූව ගමේ පිහිටි මු. පි. මාර 2660 පිඹුරේ කැබලි අංක 01 සහ 02 වශයෙන් දැක්වෙන මතු සඳහන් ඉඩම සුනාමි ව්‍යසනයෙන් අවතැන්වූවන් සඳහා බෙදා දීමට ඉඩම් අත්කර ගනු ලැබේ.

**උපලේඛනය**

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: පුවක්වත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, අවුරුදු දහයක් (10) - විස්සක් (20) පමණ වයසැති මිශ්‍ර භෝග වගාවක් සහ ස්ථිර ගොඩනැගිලි හතක් (07) ඇත; හිමිකම් කියන අය: පූජ්‍ය හක්මණ ධම්මරතන හිමි, විහාරාධිපති, කොටිකාගොඩ විහාරය, වැවහමන්දූව, මාතර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2172.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: පුවක්වත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, අවුරුදු දහයක් (10) - විස්සක් (20) පමණ වයසැති මිශ්‍ර භෝග වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: පූජ්‍ය හක්මණ ධම්මරතන හිමි, විහාරාධිපති, කොටිකාගොඩ විහාරය, වැවහමන්දූව, මාතර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0682.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 මැයි මස 05 වැනි දින පෙ. ව. 10.30 ට මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 අප්‍රේල් මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

රංජිත් යාපා,
ප්‍රාදේශීය ලේකම්.
මාතර.

2016 අප්‍රේල් මස 11 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 06

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.